# සම්භාව්‍ය සිංහල පද්‍ය සම්ප්‍රදාය හා වස්තු විෂය

බෝලියද්දේ ධම්මකුසල හිමි

## හැඳින්වීම

අනුරාධපුර යුගයේ සිට අවිච්ඡින්නව පැවත එන්නාවූ සිංහල පද්‍ය සාහිත්‍යයක් අප සතුව පවතියි. සීගිරි ගීයෙන් ආරම්භවන සිංහල පද්‍ය සාහිත්‍යයට සුවිශේෂී ස්ථානයක් හිමිවන්නේ එහි දීර්ඝකාලීන පැවැත්මත් උසස් සාහිත්‍යමය අගයත් හේතුවෙනි. ක්‍රි. ව 8, 9, 10 සියවස් වලට අයත් සීගිරි කැටපත් පවුරේ සීගිරි කුරුටු ගී ලිය වෙන්නටත් පෙර අවධියට මෙරට පද්‍ය සාහිත්‍යයේ ඉතිහාසය දිවයන බව විද්වතුන්ගේ අදහසයි. අනුරාධපුර මාමිණියා කෝරළයේ මරදන් කඩවල කොස්ගමකන්ද විහාරයෙන් හමුවූ ගීතමය ශිලාලිපියත් දකුණේ මාගම කිරින්ද ප්‍රදේශයෙන් හමුවූ ගීතමය ශිලාලිපියත් තිස්සමහරාම ශිලාලිපියත් දෙමැදඹය ශිලාලිපියත් ඒ සඳහා උදාහරණ ලෙස ඔවුහු ගෙනහැර දක්වති.[1] මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා මේ පද්‍යමය ලේඛන පිළිබඳ ව අදහස් දක්වමින් එහි ඇති පද ඝටනාව අනුව යාගී, ආර්ය, උද්ගීත, උපගීත යන වෘත්තයන්ගෙන් බැඳි බව පෙන්වා දෙයි. මීට අමතරව සියබස්ලකර, සිදත්සඟරාව, එළුසඳැස්ලකුණ හා මහාවංසය ආදී ඓතිහාසික ග්‍රන්ථවල අන්තර්ගත සාධකත් මෙරට පද්‍ය සාහිත්‍යයේ ඉතිහාසය අධ්‍යයනය කිරීම සඳහා ගෙන හැර දක්වනු ලැබේ. ශිලා ලේඛනමය සාහිත්‍යයමය හා ඓතිහාසිකමය සාධක අනුව සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යයේ ආරම්භය ක්‍රි. පූ. 03 වන සියවස තරම් ඈතට දිවයන බවට අධ්‍යයනය කළ හැකි සාධක පවතින බව පැහැදිලිවෙයි. මෙලෙස ආරම්භව විකාශනය වන සම්භව්‍ය සිංහල පද්‍ය සාහිත්‍ය සම්ප්‍රදායේ වස්තු විෂය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම ලිපියේ මූලික අරමුණ වෙයි.

සිංහල කාව්‍ය සම්ප්‍රදාය කෙරෙහි විද්වතුන් අතර විවිධ මතවාද පවතියි. සීගිරි ගීයටත් ඈත අතීතයට දිවෙන පද්‍ය සාහිත්‍ය මං සලකුණු අප සතුව පැවතිය ද ආරම්භක පද්‍ය සාහිත්‍යයේ

ස්වභාවය අධ්‍යයනය කළ හැක්කේ සීගිරි ගීයෙනි. සීගිරි ගීයෙන් දේශීය ඌරුවකින් යුත් කාව්‍ය සම්ප්‍රදායක් මෙරට ව්‍යාප්ත ව පැවති බව අධ්‍යයනය කළ හැකි ය. සීගිරි පද්‍ය පිළිබඳ ව අදහස් දක්වන මාර්ටින් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන්නේ සීගිරි බිත්තියේ ලියන ලද පද්‍යයන් අතර සංස්කෘත පද්‍යයට හෝ අලංකාරවාදයට වහල් නොවූවන්ගේ පද්‍ය බෙහෙවින් දක්නා ලැබීම සැලකිය යුත්තක් බවයි.[2] සීගිරි ගී රචනා වීමට පෙර පැවති පද්‍ය සම්ප්‍රදාය පිළිබඳ ව නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි වුවත් සීගිරි ගීයෙන් දේශීය පද්‍ය සම්ප්‍රදායක ප්‍රභාව යම්තාක් දුරකට හෝ ඉස්මතු වන බවට තර්ක කළ හැකිය. සීගිරි ගීවලින් විද්‍යමාන වන්නේ සිදත්සඟරාව ආදී ග්‍රන්ථ යන්හි උදාහරණ පාඨ ලෙස උපුටා දක්වන ලද 'අසද්දා' කව වැනි කාව්‍ය විසින් ගොඩ නගන ලද දේශීය පද්‍ය සම්ප්‍රදාය බව ගුණදාස අමරසේකර මහතා ප්‍රකාශ කරයි.[3] කෙසේ වුවත් සංස්කෘත අලංකාර වාදයේ බලපෑමෙන් සීගිරි කවීන්ට සම්පූර්ණයෙන් මිදී සිටිමට හැකි වූයේ යැයි කිව නොහැකිය.

සීගිරි ගීයේ පැවති ගී කාව්‍ය ආකෘතියේ වෙනසක් නොවූවත්, දොළොස්වන සියවසෙන් පසු සිංහල පද්‍ය සාහිත්‍යය සම්ප්‍රදාය විවිධ ප්‍රවණතා ඔස්සේ ඉදිරියට විකාශනය වී ඇත. විශේෂයෙන් සියබස් ලකර රචනා වීම සිංහල කාව්‍ය සම්ප්‍රදාය නවමු මඟකට යොමු කිරීමට බලපෑ ප්‍රධාන සාධකයකි. අලංකාරවාදී කාව්‍ය විචාර සිද්ධාන්ත මත පිහිටා රචිත සියබස්ලකර මහාකාව්‍ය සම්ප්‍රදාය මහත් ඉහළින් වර්ණනා කරයි. මතු පහළ වන කවීන් මහාකාව්‍ය සම්ප්‍රදාය අනුගමනය කළ යුතුය, යන සම්මතය ඇතිවන්නේ සියබස්ලකරේ බලපෑමෙනි.[4] පොළොන්නරු යුගයෙන් පසු සිංහල කවීන් අතර මහාකාව්‍ය සම්ප්‍රදාය මත පිහිටා කාව්‍ය රචනා කිරීම වඩාත් ප්‍රචලිත වෙයි. මුවදෙව්දාවත, සසදාවත හා කව්සිළුමිණ මේ සම්ප්‍රදාය ඉහළින් පිළිගත් පද්‍ය රචකයන්ගේ පද්‍ය සංග්‍රහ බව පැහැදිලි ය.

කුරුණෑගල යුගයේ රචනාවන සඳකිඳුරු දා කවෙන් සිංහල කාව්‍යයේ එතෙක් පැවති ගී කාව්‍ය ආකෘතිය වෙනුවට සිව්පද කාව්‍ය ආකෘතියේ ආරම්භය සිදු වේ. ගම්පොළ යුගයේ හා කෝට්ටේ යුගයේ



සිව් පදය වඩාත් ප්‍රචලිත වේ. මෙම ආකෘතික වෙනස්වීම හා සියබස්ලකරින් තවුරුවී පැවති මහාකාව්‍ය සම්ප්‍රදායට පමණක් සිංහල පද්‍ය රචකයන් සීමා නොවීම; සිංහල කාව්‍ය නව මඟකට ප්‍රවේශ වීමට බලපෑ ප්‍රධාන සාධක ලෙස හඳුනාගත හැකි ය. ගම්පොළ යුගයෙන් ආරම්භව විකාශනය වන සන්දේශ කාව්‍ය සිංහල කවීන් අතර ප්‍රචලිත වීමත් විවිධ තේමාවන් ඔස්සේ පද්‍ය රචනා කිරිමත් ගිහි පැවිදි බොහෝ පිරිසක් පද්‍ය කරණයට පිවිසීමත් ඒ සඳහා බලපා ඇත. ඒ අනුව සියවස් හත අටක තරම් එපිටින් ආරම්භව කෝට්ටේ යුගයේ දී වඩාත් දියුණුවට පත් සිංහල පද්‍ය සාහිත්‍ය කෘති තුළින් පැහැදිලිව ම සිංහල පද්‍ය සම්ප්‍රදායක් පිළිබඳ අධ්‍යයනය කළ හැකි ය. සිංහල පද්‍ය සම්ප්‍රදාය පිළිබඳ ව අදහස් දක්වන ගුණදාස අමරසේකර මහතා ප්‍රකාශ කරන්නේ සිංහල පද්‍ය සම්ප්‍රදාය කුමක් ද යන්න අවබෝධකර ගැනීමට තැත් කරන ආධුනිකයාට යට ගියාව අමතක කර සියවස් හතක් පමණ ඈතට දිවෙන කාව්‍ය වංසය හැදෑරීම හොඳට ම ප්‍රමාණවත් බවයි.[5] කෝට්ටේ යුගයේ ආරම්භ වන මෙම සිංහල කාව්‍ය සම්ප්‍රදාය සීතාවක යුගයේ අලගියවන්න කවියා දක්වා විකාශය වේ. ආරම්භය නිශ්චිත ව සඳහන් කළ නොහැකි වුවත් සීගිරි පද්‍යයන්ටත් පෙර ආරම්භවන සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යයේ අවසාන කවියාත් ජන කාව්‍ය සම්ප්‍රදායේ ආරම්භක කවියාත් අලගියවන්න මුකවෙටි තුමා ය. සීගිරි ගීයටත් පෙර සිට ආරම්භව විවිධ ප්‍රවණතාවයන් මත අවිච්ඡින්නව විකාශනය වූ සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යය බටහිර ජාතීන් මෙරට යටත් විජිතයක් බවට පත් කර ගැනීමෙන් පසු එලෙසින් ම පවත්වා ගැනීමට නොහැකි වූ බව පැහැදිලි ය. ඉන් අනතුරුව උදාවන මහනුවර යුගයේ දී අප දකින්නේ ජන කාව්‍ය සම්ප්‍රදායේ අභාසය සිංහල කවිය විෂයෙහි බෙහෙවින් බලපා ඇති ආකාරය යි. එය ද අපේ කාව්‍ය සම්ප්‍රදායේ ම විකාශනයක් බව ගුණදාස අමරසේකර මහතා සිය ''සිංහල පද්‍ය සම්ප්‍රදාය'' තුළින් පැහැදිලි කර ඇත. ''නුවර යුගය, මාතර යුගය ආදී වු යුග තුළ ලියවුණු යශෝදරාවත, වෙස්සන්තර ජාතකය, පත්තිනි හෑල්ල ආදී වූ කාව්‍ය මෙන් ම බලි තොවිල් කවි, යන්තර මන්තර, මල්යහන් කවි, යාදිනි ආදී වූ කාව්‍ය අප විසින් සැලකිය යුත්තේ

එතෙක් වියත් කවීන් අතෙහි වැඩුණු කාව්‍ය සම්ප්‍රදාය ජන කවීන් අතට පත් වීම නිසා පහළ වූ ජනකාව්‍ය වංසයක් ලෙස යි. එය අපේ කාව්‍ය සම්ප්‍රදායේ ම විකාශනයක් ලෙස සැලකිය යුතු වෙයි''. කෙසේ වුවත් එතෙක් පැවති කාව්‍ය සම්ප්‍රදායේ එනම් සම්භාව්‍ය කාව්‍ය සම්ප්‍රදායේ අවසාන කවියා ලෙස අලගියවන්න මුකවෙටි හඳුනා ගත හැකිය.

අනුරාධපුර යුගයේ සිට රචනා වන සිංහල පද්‍ය සාහිත්‍ය කෘති අධ්‍යයනය කරන විට එම කෘති ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා අධ්‍යයනය කළ හැකිය. එනම්

- සිංහල පද්‍ය සාහිත්‍ය විචාර ග්‍රන්ථ
- සිංහල පද්‍ය සාහිත්‍ය ග්‍රන්ථ

වශයෙනි. සියබස්ලකර, එළුසඳැස් ලකුණ සිදත්සඟරා මෙහි ප්‍රථම ගණයට අයත් කෘති වේ. මුවදෙව්දාවත සසදාවත, කව්සිළුමිණ ආදී සාහිත්‍යමය වශයෙන් අගය කළ හැකි ග්‍රන්ථ දෙවන කොටසට අයත් කළ හැකිය. මෙහි දී විශේෂයෙන් අප අවධානය යොමු කරන්නේ සාහිත්‍යමය අගයකින් යුත් සිංහල පද්‍ය සාහිත්‍ය සඳහා පද්‍ය සාහිත්‍ය කරුවන් යොදාගත් වස්තු විෂය සම්බන්ධයෙනි.

සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍ය සම්ප්‍රදායේ කාව්‍යමය අගය අතින් පරිපෝෂිත ආරම්භක උසස් පද්‍ය නිර්මාණ වශයෙන් විද්වතුන්ගේ සම්භාවනාවට පාත්‍ර වන්නේ සීගිරි කැටපත් පවුරේ ඇති සීගිරි කුරුටු ගීය.[6] අනුරාධපුර යුගයේ හෙවත් ආරම්භක අවධියේ පද්‍ය සාහිත්‍යයේ විශිෂ්ටත්වය කියා පෑමට සීගිරි කුරුටු ගී පමණක් වුව ප්‍රමාණවත් වෙයි. ක්‍රි. ව. 8, 9, 10 යන සියවස් ගණනාවකට අයත් සීගිරි පද්‍ය විවිධත්වය හා අව්‍යාජත්වය යන මූලික අංගයන්ගෙන් යුත්ත බව පිළිගත හැකිය. සීගිරිය නැරඹීමට පැමිණි රසවතුන් විසින් ලියන ලද ගී සමුච්චය සෞන්දර්යාත්මක වස්තුවක් නැරඹීමෙන් ලද චමත්කාරය ප්‍රකාශකිරීමට මූලික පරමාර්ථය වී ඇත. මුඛ්‍ය වශයෙන් ගිවිරිතත්, අතරින් පතර සිව්පදයත් යොදාගෙන රචිත සීගිරි කුරුටු ගී නානා තරාතිරම්වලට අයත් වූවන්ගේ අදහස් කාව්‍ය මාධ්‍යයෙන් කියා



පෑමට ගත් උත්සහයක් බව පෙනේ. සීගිරි කවීන්ගේ පද්‍ය වැඩි හරියකට වස්තු විෂය වී ඇත්තේ සීගිරි බිතු සිතුවම් ය. ඊට අමතරව සීගිරි පර්වතය, රජමාලිගාව, සිංහරූපය, කැටපත්පවුර, සීගිරියේ අවට ස්වභාව සෞන්දර්ය, සීගිරියට පැමිණීමේ දී දැනුණ දුෂ්කරතාව යනාදි වෙනත් අදහස් කෙරෙහි ද සීගිරිකවීහු අවධානය යොමු කළහ.[7]

සංස්කෘත අලංකාර ග්‍රන්ථවල හා සියබස්ලකරේ ඇති සමහර අලංකාරවලට නිදසුන් සීගිරි ගීවලින් සොයා ගැනීම දුෂ්කර නොවේ. නමුත් ඔවුහු සකු අලංකාර කෙරෙහි දැඩිව නැඹුරු නොවී සිය අදහස් නොබියව පළ කළහ. සියබස්ලකර රචනා වීමට පෙර එනම් ක්‍රි. ව. 8, 9, 10 සියවස්වලට අයත් සීගිරි ගී අධ්‍යයන කරන විට පැහැදිලි වන්නේ මෙරට සිංහල පද්‍ය සාහිත්‍යයේ වස්තු විෂය කෙරෙහි කාව්‍ය විචාරයන්හි ඇතුළත් සීමා කිරීම්වලට ලක්වී නොතිබුණු බවයි. සීගිරි ගී පරීක්ෂා කිරීමෙන් පොදුවේ එකල සම්භාවිත පද්‍ය සම්ප්‍රදාය හෝ කාව්‍යය සඳහා තෝරා ගනු ලැබූ වස්තු විෂය ගැන නිගමනයකට බැසිය නොහැකි බව ඇතැම් විද්වතුන්ගේ අදහසයි.

''...පද්‍ය රචනයේදී සීගිරි කවියාට වස්තු වූයේ ද කාන්තා සිතුවම්, පර්වත අවට පරිසරය යනාදි දේය. මෙවැනි වස්තු දැකීමෙන් කවි සිත්හි පහළ වූ චමත්කාරය කවියකින් දෙකකින් පැවසීම සීගිරි නැරඹූ රසිකයාගේ සිරිත විය. සීගිරි ගී පරීක්ෂා කිරීමෙන් පොදුවේ එකල සම්භාවිත පද්‍ය සම්ප්‍රදාය හෝ කාව්‍ය සඳහා තෝරාගනු ලැබූ වස්තු ගැන නිගමනයකට බැසිය නොහැකියි.''[8]

කෙසේවුවත් සීගිරි කවීහු සිය පද්‍ය රචනා සඳහා වස්තු විෂය සපයා ගැනීමේ දී සීගිරි අප්සරාවන් නිසා හෝ සීගිරි පර්වතය නිසා හෝ අවට පරිසරය නිසා හෝ තම සිතෙහි හටගත් හැඟීම් කැටපත් පවුරේ ඉතා සංයමයෙන් සටහන් කළහ. එයින් සීගිරි කවීන් කාව්‍ය කරණයේ දී හා වස්තු විෂය තෝරා ගැනීමේ දී දැක්වූ ස්වාධීනත්වය කැපී පෙනෙයි.

සීගිරි කුරුටු ගී හැරුණු විට අනුරාධපුර යුගයෙන් හමුවන පද්‍යයෙන් රචනා කළ කෘතියක් ලෙස හඳුනාගත හැක්කේ සියබස්ලකරයි. සියබස්ලකර පද්‍ය බන්ධනය සඳහා අවශ්‍ය අලංකාර විස්තර කරමින් දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශය මූලාශ්‍රය කරගනිමින් පද්‍යයෙන් රචිත විචාර ග්‍රන්ථයකි. මාර්ටින් වික්‍රමසිංහ මහතා සිය 'සාහිත්‍යෝදය කථා' නැමැති කෘතියේ ප්‍රකාශ කරන්නේ සියබස්ලකර කාව්‍යාදර්ශයෙහි සිංහල අනුවාදයක් බවත් සංස්කෘත ග්‍රන්ථ හදාරන කාලයක මෙබඳු පොතක් සිංහලට නගන ලද්දේ සිංහල භාෂාවේ ස්වෛරී භාවය අපේක්ෂාවෙන් විය යුතු බවයි.[9] එහෙත් එය සිංහල සාහිත්‍යයට හා භාෂාවට ගැළපෙන පරිදි වෙනස්කර ගෙන ඇත.[10] විශේෂයෙන් සිංහල කාව්‍යයේ වස්තු විෂය පිළිබඳ ඉදිරිපත් කිරීමේ දී මෙරට පාඨකයාට ගැළපෙන ලෙස යොදා ගැනීමට පද්‍ය සාහිත්‍ය කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

''පෙදෙන් බුදු සිරිත - බසින්වත් සිරිත් ඈ
පද යුතු බසින් නළු ඈ - අනතුරු ලකුණු දක්වම්''[11]

සියබස්ලකර කතුවරයා උපදේශය වන්නේ බුද්ධ චරිතය පද්‍යයෙන් වර්ණනා කළ යුතු බවයි. සිංහල පද්‍යය සාහිත්‍යයේ වස්තු විෂය පිළිබඳ කරන අධ්‍යයනයේ දී සියබස්ලකරේ ප්‍රකාශය ඉතා වැදගත් වෙයි. මෙය සියබස්ලකර ලියවුණ අවදියේ ඇති වූවක් නොව කාලාන්තරයක් තිස්සේ මෙරට පද්‍ය කරණයේ දී පිළිගැණුන අදහසක් බව ඇතැම් විද්වතුගේ මතයයි.[12] කෙසේ වුවත් සිංහල පද්‍ය කාව්‍යයේ වස්තු විෂය ආගමික කතා ඇසුරින් තෝරාගැනීමෙන් හා බුද්ධචරිතය නායක චරිතය ලෙස යොදා ගැනීමෙන් පැහැදිලි වන්නේ සිංහල පද්‍යය ජාතක කථා කාව්‍ය රචනය සඳහා ම යොදා ගැනිමට සිංහල පද්‍ය රචකයන් ප්‍රිය කළ බවයි.[13]

පද්‍ය රචනා කිරීමේ දී සීගිරි කවියේ දක්නට ලැබෙන ස්වාධීනත්වය සියබස්ලකර රචනාවෙන් පසු ශත වර්ෂ ගණනාවක් යන තෙක් සිංහල පද්‍ය සාහිත්‍යය සම්බන්ධයෙන් විද්‍යමාන නොවේ. සියබස්ලකර කතුවරයා සිංහල කවියෙහි වස්තු විෂය සම්බන්ධයෙන්



ඉදිරිපත් කරන නියමයන්ට අනුව සිංහල කවීන් පද්‍ය රචනා කිරීමට යොමු වන ආකාරය සිංහල පද්‍ය සාහිත්‍යය දෙස බලන විට හඳුනා ගත හැකිය. විශේෂයෙන් පද්‍යයෙන් බුදු සිරිත වර්ණනා කළ යුතු යැයි සියබස්ලකර කතුවරයා ඉදිරිපත් කරන මෙම ප්‍රකාශයට සමාජයේ යම් පිළිගැනීමක් ලැබුණු බව පෙනේ.[14] සෑම පද්‍ය සාහිත්‍ය කරුවෙකුම සිය පද්‍ය සාහිත්‍ය කෘති මෙම සීමාවේ සිට රචනා කිරීමට දරන උත්සහය අනුරාධපුර යුගයෙන් පසු රචනා වන බොහෝ සිංහල පද්‍ය සාහිත්‍ය ග්‍රන්ථ අධ්‍යයනය කරන විට පැහැදිලි වේ.

අනුරාධපුර යුගයෙන් පසු සිංහල ගී කාව්‍ය පහළ වූයේ අලංකාරවාදී විචාර සම්ප්‍රදාය විසින් ඇති කරන ලද දැඩි ශික්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස ය.[15] පොළොන්නරු යුගයේ ලියවෙන ප්‍රධාන ගී පොත් දෙකකි. එනම් මුවදෙව්දාවත හා සසදාවතයි. මෙම කෘති අධ්‍යයනය කිරීමෙන් පොළොන්නරු යුගයේ දී සිංහල ගී කාව්‍ය සාහිත්‍යයේ ප්‍රබල වෙනසක් ඇති වූ බව අවබෝධ වේ. විශේෂයෙන් සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යය කෙරෙහි සතු අලංකාරවාදයේ බලපෑම ප්‍රබලව විද්‍යමාන වන්නේ මේ යුගයේ සිට ය. ඒ අනුව විවිධ වෘත්ත හා අලංකාර ගීයට එකතු වනු දැකිය හැකි ය. මේ පිළිබඳ ව අදහස් දක්වන ගුණදාස අමරසේකර මහතා ප්‍රකාශ කරන්නේ සංස්කෘත අලංකාරවාදයට බිලි වූ ගීය දේශීයත්වය සහමුලින්ම අත්හළ අනුකාරක නිර්මාණ වූ බවයි.[16] අනුරාධපුර යුගයෙන් පසු ගී සාහිත්‍යයෙහි විද්‍යමාන වෙනස්කම් අතර වඩාත් කැපී පෙනෙන්නේ වස්තු විෂය සම්බන්ධයෙනි. වස්තු විෂය තෝරා ගැනීමේ දී අනුරාධපුර යුගයේ රචිත සියබස්ලකර කතුවරයාගේ ''පෙදෙන් බුදු සිරිත - බසින්වත් සිරිත් ඈ''[17] යන නියමය අනුව යමින් ජාතක කතා වස්තු විෂය කර ගන්නා ආකාරය අධ්‍යයනය කළ හැකි ය. වයසට යාමේ දී කාමභෝගී ජීවිතය ඇතහැර තපසට යාමේ අගය පහදා දෙන මඛාදේව රජුගේ චරිතය ඇතුළත් මඛාදේව ජාතකය මුව-දෙව්දාවතට වස්තු විෂය වන අතර දන්දීමේ අගය පහදා දෙන සාවෙකු ගින්නට පැන තම ශරීර මාංශය පරිත්‍යාග කිරීමට සැරසුණු ආකාරය කියවෙන සස ජාතකය සසදාවතට වස්තු විෂය වේ. මුවදෙව්දාවත හා සසදාවත ඇතුළු තවත් බොහෝ පද්‍යයන්හි පද්‍ය



16 JUL 2015

ආරම්භයේ ම සඳහන් ආකාරයට ජාතක කථාවක් වස්තු විෂය කර ගත්ත ද ඔවුන්ගේ මූලික අභිප්‍රාය වී ඇත්තේ බුදු සිරිත ජාතක කතා මාර්ගයෙන් වර්ණනා කිරීමයි. පද්‍යයෙන් බුද්ධ චරිතය වර්ණනා කිරීම සිබස්ලකරේ සඳහන් වන අතර මෙයට බෝධිසත්ව චරිතය ද අන්තර් ගත වූ බව පෙනේ.[18]

ගී සාහිත්‍යයේ විශිෂ්ටතම කෘතිය ලෙස පිළිගැනෙන්නේ දෙවන පණ්ඩිත පරාක්‍රමබාහු රජුගේ කව්සිළුමිණ නම් මහා කාව්‍යයයි. දඹදෙණි යුගයට අයත් යැයි පිළිගැනෙන කව්සිළුමිණ ගී කාව්‍ය ආකෘතියෙන් රචනා කරන ලද විශිෂ්ටතම පද්‍ය සාහිත්‍ය කෘතිය ලෙස අගය කිරීමට ලක් කළ හැකිය. සංස්කෘත අලංකාරවාදයේ බලපෑම වඩාත් කැපී පෙනෙන මහා කාව්‍යයක් සේ රචනා කරන ලද කව්සිළුමිණෙහි ගතානුගතික සංස්කෘත අලංකාරයන්ගෙන් රචිත වැනුම්වලින් සමන්විත වෙයි. මාර්ටින් වික්‍රමසිංහ මහතා 'සිංහල සාහිත්‍යයේ නැගීම නම් සිය විචාර ග්‍රන්ථයේ දී සංස්කෘත විචාර ග්‍රන්ථ ලක්දිව පැතිරයාමේ උසස්ම ප්‍රතිඵලය ලෙස නිදසුන් කළ හැක්කේ කව්සිළුමිණ බව ප්‍රකාශ කරයි.[19] එබැවින් සංස්කෘත අලංකාරවාදයේ අග්‍ර ඵලය ලෙස විද්වත් සම්භාවනාවට කව්සිළුමිණ පත් වේ. විශේෂයෙන් කතුවරයා සිංහල පද්‍ය සාහිත්‍ය කරුවාට සියබස්ලකරෙන් පනවන ලද නියමය තුළ ඉඳිමින් මහාකාව්‍ය අංගයන්ගෙන් යුක්තව පද්‍ය රචනා කිරීමට දරන උත්සහය කැපී පෙනේ. කව්සිළුමිණකරුවා ප්‍රධාන වශයෙන් මුහුණ දෙන ගැටලු දෙකක් හඳුනා ගත හැකි ය. එනම් මහාකාව්‍යයක් රචනා කිරීම හා බෝසත් සිරිත වස්තු විෂය කර ගැනීම යන පරමාර්ථ දෙකම එකට ඉෂ්ට කර ගැනීමට කතුවරයා දරන ප්‍රයත්නය යි. කතුවරයාගේ මේ ප්‍රයත්නය ආරම්භක පද්‍ය කීපයක් අධ්‍යයනය කරීමෙන් තේරුම් ගත හැකි ය.

''කිවිබැව් කිවිදුමේ - කුසුම් සැපතෙහි විපුල්
පෙලෙ බෝසත් සර වැනුම් - වියතෙ මුව පත් වේවා''[20]



බෝධිසත්ව චරිතයක් වර්ණනා කිරීම කවි කමෙහි ඵල ගැන්වීමකැයි කව්සිළුමිණ කරුවා ප්‍රකාශකරයි. මහාකාව්‍යයක් රචනා කළ ද කව්සිළුමිණ කවියා බෝසත් චරිතය වර්ණනාව කාව්‍යයක ඵලය විය යුතුය, යන ප්‍රකාශයෙන් පද්‍ය කෘතියක් සඳහා වස්තු විෂය තෝරා ගැනීමේ දී පැවති සීමාවන් පිළිබඳ අවබෝධයෙන් කව්සිළුමිණ රචනා කළ බව වැටහෙයි.

කව්සිළුමිණ කවියා මහා කාව්‍යයක් රචනා කිරීමට යාමේ දී ඊට අවශ්‍ය පරිදි ජාතක කතාවේ ඇතැම් චරිත හා අවස්ථා සකස් කර ගනිමින් කව්සිළුමිණ රචනා කරයි.[21] එය කාව්‍ය රසය පමණක් කවියෙන් අපේක්ෂා කරන පාඨක පිරිසකගේ විවේචනයට ලක් නොවනු ඇත. එහෙත් කාව්‍යයෙන් බුදු සිරිත වර්ණනා කිරීම සිදු විය යුතු යැයි පිළිගත් සමාජයක එබඳු වෙනසක් විවේචනයට ලක් වීම නොවැළැක්විය හැකි කාරණයකි. එය දත් කිවියා ජාතක කතාවක් වස්තු විෂය කරගත්ත ද කව්සිළුමිණ රචනාකිරීමේ මූලික පරමාර්ථය කාව්‍යය අගය අතින් උසස් කෘතියක් රචනා කිරීම බව කතුවරයා ග්‍රන්ථ ආරම්භයේ ම කරන ප්‍රකාශයෙන් පැහැදිලි වෙයි.

''තමා වරදස නො දිස්නේ - මෙරමා දොස්ම දිස්නේ
නුවන් බැහැර නහමත් - තමා මුත් නොදක්නේ කිම්''[22]

''සරසවිය බැලුමසෙක්නි - වෙත්වා කිවි දෙනෝ
පෙදෙහි රසහව් විදුනා - දෙනෙතා ඉතා දුලබෝ''[23]

''තමාගේ වරදින් බිඳකුදු කෙනෙකුට නොපෙනේ. උනුන්ගේ වැරදි පෙනෙන්නේය. ඇස් අර පිටත බැලුව හොත් තමාහැර නො දකින්නේ කුමක් ද?''

''සරසවියගේ මද බැල්මකිනිදු ජනයා කිවිහු වෙත්වා. කාව්‍යයෙහි රස හා භාව විඳිය හැක්කා වූ අය නම් ඉතා දුර්ලභය හ.''

බුදුන්ට හෝ තෙරුවන්ට නමස්කාර කරමින් ග්‍රන්ථ ආරම්භ කිරීම සාමාන්‍යයෙන් සිංහල පද්‍ය කාව්‍යයන්හි දැකිය හැකි ස්වභාව ය

යි. ඒ වෙනුවට ආරම්භක කවියෙන් තමන්ගේ වරදට වඩා අන් අයගේ දෝෂය දැකීමේ ලෝකයේ ස්වභාවය පිළිබඳ ව කව්සිළුමිණ කතුවරයා සඳහන් කරයි. අනතුරුව අන් කාරණාවලට වඩා කවියෙහි රස භාව විඳිය හැකි ජනයා දුර්ලභ බව ලෝකයෙහි ස්වභාවය ගැන සඳහන් කරමින් කෘතිය ආරම්භ කරයි. එබඳු ස්වභාවයෙන් යුක්ත වූ ලෝකයෙහි තම කාව්‍යයට විවේචන එල්ල වීම කවියා අපේක්ෂා කළ බව පැහැදිලි ය. මෙමගින් හැඟෙන්නේ සමාජය කාව්‍යයක් රචනා කිරීමෙන් හුදු කාව්‍ය රසයක් විඳිනවාට වඩා ඊට එහා ගිය තවත් කාරණා කාව්‍යයක් තුළින් අපේක්ෂා කළ බවයි. එනම් සියබස්ලකර කෘතියෙහි ඉදිරිපත් කළ පද්‍යයෙන් නම් බුදු සිරිත වර්ණනා කිරීම යන්න විය හැකි ය.

සීගිරි ගීවලට පසු සංස්කෘත කාව්‍ය අලංකාරයන්ට යට වූ මධ්‍යතන යුගයේ රචිත සිංහල කාව්‍යයන්හි වස්තු විෂය අතින් සිංහල කවියට ආවේණිකවූ ජාතක කථා මූලාශ්‍ර කරගනු ලැබේ. මුවදෙව්දාවත, සසදාවත හා කව්සිළුමිණ කාව්‍ය තුනෙන් ම එය විද්‍යමාන වේ. එහෙත් ජාතක කතාව සංස්කෘත මහාකාව්‍යයන්හි අන්තර්ගත වර්ණනාවලින් සැරසීම මෙන් ම ඇතැම් විට මහා කාව්‍ය ආකෘතියට ගැළපෙන ලෙස ජාතක කතාවේ චරිත හා අවස්ථා වෙනස් කර ගැනීම සිදු කර ඇත. ජාතක කතා වස්තු විෂය කර ගැනීම හැරුණු කොට අනෙක් සෑම අවස්ථාවකම මේ කවීහු සංස්කෘත කාව්‍ය ශෛලිය මහත් අභිරුචියෙන් අනුගමනය කළහ. එබැවින් මධ්‍යතන යුගයේ සිංහල පද්‍යයෙහි භූෂණ බහුල කෘත්‍රිම ස්වරූපයෙන් යුත්, මහා කාව්‍ය අච්චුවට ජාතක කතා ආයාසයෙන් සම්බන්ධ කිරීම දැකිය හැකි පොදු ලක්ෂණයකි.[24]

සියබස්ලකර කතුවරයා බුදුසිරිත පද්‍යයෙන් වර්ණනා කිරීමට නියමයක් පැනවුව ද සැබවින්ම ඔවුන් එම නියමය තුළ සිට පද්‍ය රචනා කළේ ද යන්න මදක් විමසා බැලීම වැදගත් ය. චිරන්තන සිංහල පද්‍ය සාහිත්‍යයේ ඉතා උසස් කෘති ලෙස පිළිගැනෙන මුවදෙව්දාවත, සසදාවත හා කව්සිළුමිණ ආදී ආරම්භක පද්‍ය සාහිත්‍යයන්හි සිට පසුකාලීනව රචනාවන බොහෝ පද්‍ය කෘතීන්ට



පද්‍ය රචකයන් වස්තු විෂය කර ගන්නේ ජාතක කතාවන් ය. ජාතක කතා කරුවා සිය කතාවස්තූන් මගින් විවරණය කරන්නේ බුදු සිරිත නොව බෝසත් සිරිතයි. ඒ අනුව සියබස්ලකර කතුවරයා පද්‍ය සාහිත්‍යයේ වස්තු විෂය සඳහා පැනවූ මෙම නියමය පද්‍ය සාහිත්‍ය කරුවන් අවධානයට ගෙන නොමැති බව තර්ක කළ හැකිය. එසේ තර්ක කිරීමට තවත් ප්‍රබල සාධකයක් වන්නේ, සියබස්ලකරේ නිරිදිෂ්ට කවරක් වුවත් සැබවින් ම බුද්ධ චරිතය වර්ණනා වූයේ පද්‍ය කවීන් අතින් නොව ගුරුළුගෝමි, විද්‍යාචක්‍රවර්ති ආදි ගද්‍ය ලේඛක-යන් අතින් බවට සාධක පැහැදිලි ලෙස දකන්නට ලැබීමයි.''[25]

සියබස්ලකර කෘතියෙහි සිංහල පද්‍යයේ වස්තු විෂය පිළිබඳ නිර්දිෂ්ට නියමය අනුගමනය කළේ යැයි තර්ක කළ හැක්කේ පැරණි සිංහල කවියා බුදු සිරිත, බෝසත් සිරිත යන දෙක එකක් ලෙස ම සැලකූ බව අනුමාන කිරීමෙන් බව ඇතැම් විද්වතුන්ගේ මතයයි.[26] මුවදෙව්දාවත, සසදාවත හා කව්සිළුමිණ යන මූලික ගීකාව්‍ය හා පසුකාලීනව රචනා වන සිංහල කාව්‍ය සඳහා ජාතක කතා වස්තු විෂය කර ගැනුන ද එයින් අපේක්ෂා කර ඇත්තේ බුදු සිරිත වැනීම බව පෙනේ.

''අප මුනිදෙක් කලක් - රජසිරි පැමිණි යෙහෙන්
වෙසෙමින් ඉස නරක් දුටු - කෙණෙහි ඉසි වෙස් රිස් වී''[27]

''දැක සා බමුණා - මුනි විරු එ සස කල්හි
දල මැද්'රා සිසි දිසි - සිය මස්නි පුස්නා ලෙන්''[28]

''කිව්බැව් කිවිඳුමේ - කුසුම් සැපතෙහි විපුල්
පෙලෙ බෝසත් සර වැනුම් - වියතෙ මුව පත් වේවා''[29]

''බැඳි කිවියර බසින්
මුනිඳු සිරිතක් වෙසෙසින්''[30]

සිංහල ගී හා සිව්පද කවීහු ජාතක කථා සිය පද්‍ය සාහිත්‍ය කෘති සඳහා වස්තු විෂය කරගනිමින් බුදු සිරිත වර්ණනා කිරීමට



ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
16 JUL 2015

අපේක්ෂා කළහ. සංස්කෘත අලංකාරවාදයේ බල පෑමෙන් බිහි වූ මහාකාව්‍ය සම්ප්‍රදාය අනුව රචිත කව්සිළුමිණකරුවා පවා සියබස් ලකර කතුවරයා ඉදිරිපත් කරන මෙම නියමය අනුගමනය කරන්නට දරන උත්සහය ග්‍රන්ථාරම්භයේ ම බෝධිසත්ව චරිතයක් වර්ණනා කිරීම කවි කමෙහි ඵල ගැන්වීමකැ යි.[31] යනුවෙන් කරන ප්‍රකාශයෙන් පැහැදිලි කර ගත හැකිය. කෙසේ වුවත් මහා කාව්‍යයට උචිත පරිදි ජාතක කතාව වෙනස් කිරීමට අප කවියා අපේක්ෂා කළ බැවින් සමාජයෙන් එල්ල විය හැකි අපවාදයෙන් ගැළවීම සඳහා ඉහත කාව්‍ය ප්‍රකාශය කවියා ඇතුළත් කළා විය හැකිය. කෙසේ වුවත් ජාතක කතා වස්තු විෂය කර ගැනීම ආරම්භක යුගයන්හි සිට ම පද්‍ය සාහිත්‍ය සම්බන්ධයෙන් විද්‍යමාන වන පොදු ලක්ෂණයකි. ඒ අනුව සම්භාව්‍ය සිංහල පද්‍ය රචකයන් සිය වස්තු විෂය තෝරා ගැනීමේ දී සියබස්ලකරෙහි නියමය ඉක්මවා නොගිය බව පැහැදිලි ය.

දඹදෙණි කතිකාවතෙහි ''කාව්‍ය නාටක ආදී ගර්හිත විද්‍යා තමා නූගත යුතු, අනුනුත් නූගැන්විය යුතු'' යනුවෙන් සඳහන් වේ[32]. මෙම නියමයට අනුව කාව්‍ය හා නාටක රචනය භික්ෂූන්ට සහමුලින්ම තහනම් විය. සද්ධර්මරත්නාවලියෙහි ද ධර්මසේන හිමියෝ කාව්‍ය නාටකාදිය නිෂ්ප්‍රයෝජන කථා ලෙස බැහැර කළහ.[33] එහෙත් කතිකාවත ගණනකට නොගත් 14 වන සියවසේ මුල් භාගයේ විසූයේ යයි සලකන විල්ගම්මුල මහා සංඝරාජ ස්වාමීහු සඳකිඳුරුදා කව ලියා මහා කාව්‍ය විප්ලවයකට පුරෝගාමියා වූහ. එළිසම කාව්‍ය ග්‍රන්ථයන්ගේ ප්‍රථම කෘතිය මෙන් ම භික්ෂුවකගේ ප්‍රථම කාව්‍යය ද මෙය යැයි සැළකේ. මෙහි එළිසම ගී රාශියක් ඇත. මීට පෙර රචනා වී ඇති සීගිරි ගී, මුවදෙව්දාවත හා එළුසඳැස් ලකුණ යන ග්‍රන්ථවල එළිසම ගී ඇතත් මෙසේ බහුලව නැත.

සිංහල පද්‍ය සාහිත්‍ය පිළිබඳ අධ්‍යයනයේ දී තවත් වැදගත් යුගයත් ලෙස කුරුණෑගල යුගය හඳුනාගත හැකි ය. විශේෂයෙන් පද්‍ය සාහිත්‍යයේ එතෙක් පැවති ගී කාව්‍ය ආකෘතිය වෙනුවට සිව්පද කාව්‍ය ආකෘතියේ ආරම්භය සිදු වන්නේ කුරුණෑගල යුගයේ දී ය. පද්‍ය කෘති බොහොමයක් විද්‍යමාන නොවුනත් මේ යුගයේ ද ජාතක



කතා කවිය විෂයෙහි වස්තු විෂය කර ගන්නා ආකාරය හඳුනාගත හැකි ය. කුරුණෑගල යුගයේ රචනා වී ඇත්තේ එක් පද්‍ය කෘතියකි. එනම් සඳකිඳුරුදා කවයි. සඳකිඳුරු ජාතකය පාදක කර ගනිමින් රචනා කෙරෙන මෙම පද්‍ය කෘතිය සිව්පද ආකෘතියෙන් රචනා කරයි. කුරුණෑගල යුගයෙන් පසු සිංහල පද්‍ය සාහිත්‍යයෙහි වඩාත් ප්‍රචලිත වන්නේ සිව්පද කාව්‍ය ආකෘතියයි. කරුණෑගල යුගයෙන් සිංහල පද්‍ය කාව්‍යයේ ආකෘතියේ වෙනසක් සිදු වුව ද වස්තුවිෂය සාම්ප්‍රදායිකව පැවති ජාතක කථා වස්තු විෂය කර ගත් බව පැහැදිලි ය.

කුරුණෑගල යුගයේ සඳකිඳුරු දා කවෙන් ආරම්භවන සිව්පද කාව්‍ය සම්ප්‍රදාය තව දුරටත් විකාශනය වන්නේ ගම්පොළ යුගයේදී ය. ආකෘතියේ වෙනසක් මේයුගයේ සිංහල පද්‍ය සාහිත්‍ය සම්බන්ධයෙන් අධ්‍යයනය කළ හැකිවාක් මෙන් ම වස්තු විෂයෙහි ද වෙනස්කම් විද්‍යමාන වන යුගය ලෙස ගම්පොළ අවදිය හඳුන්වා දිය හැකිය. ගම්පොළ යුගයේ දී සිංහල පද්‍ය සාහිත්‍ය සම්බන්ධයෙන් කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ සන්දේශ කාව්‍ය ආරම්භ වීමයි. ගම්පොළ යුගයේ සිට ලියවුණු සෑම සන්දේශ කාව්‍යයකම ප්‍රධානම ආකෘතිය වන්නේ සිව් පදය යි. ගම්පොළ යුගයෙන් පසු රචනා වන බුදුගුණ අලංකාරය, කාව්‍යශේඛරය, ගුත්තිලය, දහම්සොඬකව, කුස ජාතකය කුස්තන්තීනු හටන ආදි ග්‍රන්ථ රාශියකම සිව්පදය විද්‍යමාන වේ.

සිව්පද කාව්‍ය ආකෘතියෙන් රචනා වන සන්දේශ කාව්‍යයන් වඩාත් දියුණු වන්නේ කොට්ටේ යුගයේ දී ය. කෝට්ටේ යුගයේ පමණක් රචනා වන කාව්‍ය ගණන පහකි. එනම්

- පරවි සන්දේශය
- සැලළිහිණි සන්දේශය
- කෝකිල සන්දේශය
- හංස සන්දේශය
- ගිරා සන්දේශය. යනුවෙනි.

සන්දේශ කාව්‍ය ආරම්භයත් සමගම සිංහල පද්‍ය සාහිත්‍යයෙහි වස්තු විෂය ද වෙනස් වන ආකාරය පැහැදිලිව විද්‍යමාන වෙයි. සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යයේ වස්තු විෂය බුදු සිරිතට එසේත් නැතිනම් බොසත් සිරිතට හෙවත් ජාතක කතාවලට සීමා වී තිබුණු අතර සන්දේශ කාව්‍යවලින් එම සීමාව ඉක්මවා පද්‍ය කරණයට මෙරට පද්‍ය රචකයන් යොමු වන ආකාරය පැහැදිලි වෙයි. සන්දේශ කාව්‍යයන්ගේ වස්තු විෂය බවට පත් වන්නේ යම් අරමුණක් මුදුන් පමුණුවා ගැනීමට දෙවියන් වෙත යවන සන්දේශයකි. එහි දී විශේෂයෙන් දූතයා යන ගමන් මඟ අප කවියාගේ නොමද වර්ණනාවට ලක් වෙයි. මඟ දෙපස හමුවන සෑම වස්තුවක්ම සන්දේශ කවීන් වර්ණනා කරන අතර පිළිම ගෙවල්, ස්වභාව සෞන්දර්ය, නොයෙකුත් පූජනීය ස්ථාන සන්දේශ කරුවාගේ වස්තු විෂය බවට පත් වේ. දේශීය පරිසරය, ස්ථාන හා පුද්ගලයන් මෙන් ම දේශීය ජනයාගේ ජීවන තතු සන්දේශ කරුවන්ගේ වර්ණනාවල වස්තු විෂය බවට පත් වෙයි.

කෝට්ටේ යුගය තුළ සන්දේශ පමණක් නොව තවත් විවිධ පද්‍ය සාහිත්‍ය කෘති ගණනාවක් නිර්මාණය වූ යුගයකි. උපදේශ කාව්‍ය, බුදුගුණ කාව්‍ය, ජාතක කාව්‍ය ආදී වශයෙන් විවිධ වස්තු විෂයන් ඔස්සේ පද්‍ය රචනා වන ආකාරය අධ්‍යයනය කළ හැකිය. මේ පිළිබඳව අදහස් දක්වන පී. බී සන්නස්ගල මහතා 'සිංහල සාහිත්‍ය වංසය කෘතියේ දී දකුණු ඉන්දීය විරිත් අනුව වැඩීගෙන ආ හෙළ කවිය කෝට්ටේ යුගයේ දී පුදුම දියුණුවක් ලද බව ප්‍රකාශ කරයි.

> ''කෝට්ටේ කාලයේ දී ලියවී ආ ලෝවැඩසඟරාව නිසා උපදේශකාව්‍යයන්ගේ ද, එළුසිලෝසතකය නිසා භක්ති කාව්‍ය යන්ගේ හා ශතක කාව්‍යයන්ගේ ආරම්භය පෙනීයයි.දකුණු ඉන්දීය විරිත් අනුව වැඩී ආ හෙළ කවියේ පුදුම නැගීම ද කෝට්ටේ කාලයේ සිට දක්නට ලැබේ. රජුන්ට ස්තෝත්‍ර බැඳ කියැවීමේ සිරිත හා සටන් පුවත් පැම නිසා හටන් කවියේත්, මාදේවි පුවත වැනි සිද්ධීන් නිසා ශෘංගාර කවියේත් නැගීම ද,



> මේ අතර, කවියෙන් බණ කීමේ සම්ප්‍රදාය නිසා කවි බණ ලිවීමේ සිරිත් ද මේ කාලයේ දී ඇරඹී තිබේ. බෝසත්සිරිත් වැනුම වශයෙන් ජාතක කථා කවිකර පෑමේ සිරිත මුල් කාලයේ සිටම අනුදත් මඟක් වුවත්, ඒවා කවි බණ හැටියට ලිවීමට පටන් ගැනුණේ මධ්‍යතන යුගයේ මේ අවසාන කාලයේදී ය. එහි තවත් පැත්තක විකාශනයක් හැටියට වන්දනා කාව්‍යයන්ගේ බිහිවීමද දිස්වේ. තුන් සරණ වැනි ඒ පොත්පෙළ සෙංකඩගල කාලයේ සිට සාහිත්‍යයට එක් වී ඇත.'' [34]

ඒ අනුව කෝට්ටේ යුගය සිංහල පද්‍ය සාහිත්‍යයේ වස්තු විෂය අතින් පුළුල් පරාශයක විහිදෙන බව පැහැදිලිය. සියබස්ලකරින් සිංහල කවීන් විෂයෙහි වස්තු විෂය සම්න්ධයෙන් පනවන ලද නියමය කෝට්ටේ යුගය වන විට බොහෝ දුරට සිංහල කවීන්ගෙන් ඈතට ගොස් ඇත.

කෝට්ටේ යුගයේ අවසාන කාලසීමාවේ දී සිංහල කවිය නැවත පිරිහී යන අයුරු විද්‍යමාන වේ. ඉන් පසුව සාහිත්‍ය කරණයට පිවිසි එකම පද්‍ය රචකයා වූයේ අලගියවන්න මුකවැටි තුමා ය. කව්සිළුමිණ කරුවාට වස්තු විෂය වූ කුස ජාතකය වස්තු විෂය කර ගනිමින් කුස ජාතක කාව්‍යය් මෙතුමා රචනා කරයි. සිංහල පද්‍ය සඳහා ජාතක කථා වස්තු විෂය කර ගැනීමේ ආරම්භයේ සිට පැවති සම්ප්‍රදාය මේ දක්වා පැවති බවට අලගියවන්නගේ කුසජාතක කාව්‍ය හොඳ නිදසුනකි. මෙතුමාගේ සුභාෂිතය, ලෝකෝපකාරය වැනි උපදේශ කාව්‍ය අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වන්නේ වස්තු විෂය අතින් ගත් කල කෝට්ටේ යුගයේ පැවති කාව්‍ය සම්ප්‍රදායන් ඔහුගේ පද්‍ය රචනා සඳහා බල පා ඇති බවයි.

පෘතුගීසින්ට මෙරට යටත්ව පැවති කාලයේ පද්‍ය සාහිත්‍ය කරණයේ නියුතු අලගියවන්න මුකවැටි පඬිතුමාගේ සිංහල පද්‍ය කෘති අතර වස්තු විෂය අතින් නව ප්‍රවේශයක් ගන්නා බව එතුමන්ගේ කුස්තන්තීනු හටන් කාව්‍යයෙන් පෙනේ. මෙතෙක් සිංහල පද්‍ය

සාහිත්‍යයෙහි හටන් කාව්‍ය යනුවෙන් පද්‍ය හමු නොවූවත් මුව දෙව්දාවත, සසදාවත, කව්සිළුමිණ ආදී ගී කාව්‍යයන්ගේ මෙන් ම පැරකුම්බා සිරිත, සන්දේශ කාව්‍ය යනාදී ග්‍රන්ථයන්හි රජවරුන් හා ඔවුන්ගේ වීර වික්‍රමයන් පිළිබඳ වර්ණනා දැකගත හැකි ය. විශේෂයෙන් දණ්ඩීන්ගේ "කාව්‍යාදර්ශය" ගුරුකොට ගෙන ක්‍රි. ව. 9 වෙනි 10 වෙන සියවස්වල ලියැවිණැයි සැලකෙන සියබස්ලකරින් අනුදක්නා ලද මඟ පෙන්වීම නිසා පසුකිලීන කවියන්ගේ ගමන් මඟ ද වෙනස් විය. පූර්වයෙහි සංස්කෘතයෙන් ලියන ලද කෘතීන් හා සංස්කෘත විචාර ග්‍රන්ථ අනුව රචනා වුණු සියබස්ලකරින් කතුවරයා ද මහා කාව්‍ය ලක්‍ෂණ විස්තර කිරීමට ද අමතක නොකළ බව පෙනේ. එහි දී කතුවරයා යුද වැනුමක අවශ්‍යතාව පළ කර ඇත්තේ මෙසේ ය.

''පෙළඹුම් විවා ගැණුම් - කුමරුනු පැන් වැඩමෙන්
මතුරුදු දූ ගමන් යුද - උලාර නා උදෙනි දූ "[35]

යුද්ධයක් සහ උදාර වූ නායකයාගේ ජයග්‍රහණයක් පිළිබඳ වර්ණනා මහාකාව්‍යයක අඩංගු විය යුතු බව මේ අනුව පැහැදිලි වේ. ඒ මඟ ඔස්සේ ගමන් ගත් පසුකාලීන සිංහල පද්‍ය රචකයින් මහාකාව්‍යයන් සඳහා පමණක් නොව, කවිසමයානුගතවීම සඳහා සෑම නිර්මාණයක් තුළට ම යුද වැනුමක් ඈඳා ගත්තේ මහත් අභිරුචියෙනි. නමුත් සත්‍ය වශයෙන් ම සිදු වූ හටනක් වස්තු විෂය කරගනිමින් පද්‍ය රචනා කිරීම සම්බන්ධයෙන් පළමු ග්‍රන්ථය ලෙස ඉදිරිපත් කළ හැක්කේ අලගියවන්න මුකවැටිතුමාගේ කුස්තන්තීනු හටනයි. ඒ අනුව සිංහල සාහිත්‍යාවලියට එක් වූ ප්‍රථම හටන් කාව්‍යය වූයේ අලගියවන්න මුකවෙටිතුමාගේ කුස්තන්තිනු හටනයි. කුස්තන්තිනු ද සා නැමති පාතුගීසි සෙන්පතියා අන්තෝනි බරෙන්තු නමැත්තෙකුට විරුද්ධව කළ සටනක තොරතුරු මෙහි ඇතුළත් ය. කුස්තන්තිනු හටන් කාව්‍යයෙන් පසු හටන් කාව්‍ය සිංහල සාහිත්‍යයේ නවාංගයක් ලෙස විකාශනය වේ. කෙසේ වුවත් ප්‍රතිකාලූන්ගේ පැමිණීමෙන් පසු ඇති වූ සාහිත්‍යයේ පරිහානිය වැළැක්වීමට අලගියවන්නගේ උත්සහය ප්‍රමාණවත් නොවූ බව විද්වතුන්ගේ මතයයි.[36]



ඓතිහාසික යුගයේ සිට අවිච්ඡින්නව විකාශනය වූ පද්‍ය සාහිත්‍යයක් සිංහලයන් සතුව පැවති බව ට ඉදිරිපත් කළ හැකි ඓතිහාසික හා සාහිත්‍යමය ප්‍රබල සාධක අප සතු වෙයි. සිංහල පද්‍ය සාහිත්‍යයේ ආරම්භය නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි වුවත් සීගිරියෙන් හමු වූ ගී කාව්‍ය පැහැදිලි ලෙසම දේශීය කාව්‍ය සම්ප්‍රදායක් පැවති බවට සාක්ෂි සපයයි. සංස්කෘත විචාර ග්‍රන්ථයන්ගේ හා ඒ අනුව යමින් සියබස්ලකර නම් සිංහල විචාර ග්‍රන්ථය රචනා වීමෙන් පසු සිංහල පද්‍ය සාහිත්‍යය සංස්කෘත අලංකාරවාදයේ ග්‍රහණයට හසු වීමත් සමග දේශීය කාව්‍ය සම්ප්‍රදාය යටපත් වන අයුරු පොළොන්නරු හා දඹදෙණි යුගයන්හි රචිත ගීකාව්‍යයන්ගෙන් පැහැදිලි වේ. සඳකිඳුරු දා කවෙන් ආරම්භව ගම්පොළ යුගයේ හා කෝට්ටේ යුගයේ සිංහල කාව්‍යයේ ප්‍රධාන කාව්‍ය ආකෘතිය ලෙස විකාශනය වන සිව්පදයත් සමග දේශියයැයි කිව හැකි සිංහල කාව්‍ය සම්ප්‍රදාය නැවත ඉස්මතු වීම දැකිය හැකිය. මෙම පදය සාහිත්‍ය දේශිය පරිසරය, දේශිය මිනිසුන්ගේ සිතුම් පැතුම් සමග ඒකාබද්ධ වී තිබීම මූලික ලක්ෂණයකි. එබැවින් භාවාත්මක ලෙස සහෘදයාට වර්තමානයේත් කෝට්ටේ යුගයෙන් පසු බිහිවන සාහිත්‍ය කෘති සමග ගනු දෙනු කළ හැකි වෙයි. එහෙත් කෝට්ටේ යුගයේ අවසාන කාලයේ දී සිංහල කාව්‍යයෙහි ඉස්මතුවූ කාව්‍ය සම්ප්‍රදාය යටපත් වී යයි. ඉන් අනතුරුව සිංහල කවිය ජන කාව්‍යයේ අභාසය ලබමින් ඉදිරියට විකාශනය වෙයි. කෝට්ටේ යුගයේ අවසාන කාලසීමාවේ දී ඓතිහාසික යුගයේ සිට විකාශනයවූ සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍ය යුගය අවසන් වන අතර එහි අවසාන කවියා ලෙස අලගියවන්න මුකවැටි පඩිතුමා හඳුනාගත හැකි ය.

සිංහල පද්‍ය සාහිත්‍යයේ වස්තු විෂය පිළිබඳ අධ්‍යයනයේ දී පැහැදිලිවම සීගිරි කවියාගේ ස්වාධීනත්වය කැපීපෙනෙයි. සීගිරිය හා එහි බිතු සිතුවම් නැරඹීමෙන් සහෘදයා තුළ ඇතිවූ හැගීම් ප්‍රකාශ කිරීම එහි මූලික පරමාර්ථය වී ඇත. අනුරාධපුර යුගයේ රචනා වන සියබස්ලකර හා සංස්කෘත කාව්‍ය අලංකාරයන්ගේ බල පෑමෙන් බිහිවන සිංහල ගීකාව්‍ය සාහිත්‍යයේ වස්තු විෂය තෝරා ගැනීමේ දී සියබස්ලකර ඉදිරිපත් කරන නියමයට අනුව සිදුවන බව පෙනේ. ඒ

අනුව ඉන් පසු සාහිත්‍ය කරණයට පිවිසි බොහෝ දෙනා මෙම සීමාව තුළ සිට පද්‍ය සාහිත්‍ය සඳහා වස්තු විෂය තෝරා ගත්හ. විශේෂයෙන් ම අනුරාධපුර යුගයෙන් පසු සිංහල ගී කාව්‍ය රචකයන් සංස්කෘත අලංකාර වාදීන්ගේ මහා කාව්‍ය ලක්ෂණ අනුගමනය කිරීම නිසා විවිධ වර්ණනා සිංහල ගී කාව්‍යයන්ට එක් කර ඇත. ඒ තුළ ද විද්‍යමාන වන්නේ දේශීය යැයි කිව හැකි වර්ණනා නොව ගතානුගතික සංස්කෘත රීතියට ගුරුකොට ගත් වර්ණනාවන් ය. එබැවින් වස්තු විෂය තෝරා ගැනීම සම්බන්ධයෙන් සීගිරි කවියෙන් විද්‍යමාන ස්වාධීන ලක්ෂණ පොළොන්නරු යුගයේ හා දඹදෙණි යුගයේ රචනාවන ගී කාව්‍යයන්හි විද්‍යමාන නොවේ. කෝට්ටේ යුගයේ සහ ඉන් පසුව සිංහල සාහිත්‍යයේ වස්තු විෂය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන්නේ සියබස්ලකරේ නියමයට අනුව ජාතක කථා පමණක් තෝරා නොගෙන විවිධ අංශයන් කෙරෙහි සිය වස්තු විෂය තෝරා ගැනීමේ දී පද්‍ය රචකයන් අවධානය යොමු කර ඇති බවයි. විශේෂයෙන්ම දේශීය පරිසරය හා දේශීය මිනිසුන්ගේ සිතුම් පැතුම් මෙම පද්‍ය සාහිත්‍යයන්ට වස්තු විෂය වීම නිසා කෝට්ටේ යුගයෙන් පසු බිහිවන පද්‍ය සාහිත්‍ය වස්තු විෂය අතින් මෙරට මිනිසුන්ට වඩා සමීප වී ඇත.

## ආන්තික සටහන්

---

[1] කොත්මලේ අමරවංශ හිමි, **සිංහල සාහිත්‍යලතා,** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2000, පිටුව 12.

[2] මාර්ටින් වික්‍රමසිංහ, **සිංහල සාහිත්‍යයේ නැගීම,** දෙහිවල: සීමා සහිත තිසර ප්‍රකාශකයෝ, 1997, පිටුව 14.

[3] ගුණදාස අමරසේකර, **සිංහල කාව්‍ය සම්ප්‍රදාය,** බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ, 1998, පිටුව 43.

[4] රෝහිණී පරණවිතාන (පරි), **සිංහල ගී කාව්‍ය කෙරෙහි සංස්කෘත අලංකාර ශාස්ත්‍රයේ බලපෑම,** බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ, 2009, පිටුව 73.



---

[5] ගුණදාස අමරසේකර, **සිංහල කාව්‍ය සම්ප්‍රදාය,** බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ, 1998, පිටුව 03.

[6] ඒ. වී. සුරවීර, **සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය,** කැලණිය එස්. ස්වර්ණා ද සිල්වා ශිලා ප්‍රින්ටින් වර්ක්ස්, කැලණිය, 1998, පිටු 35 - 36.

[7] අමරවංශ හිමි, **එම,** 2000, පිටුව 174.

[8] සුරවීර, **එම,** 1998, පිටුව 39.

[9] මාර්ටින් වික්‍රමසිංහ, **සාහිත්‍යෝදය කථා,** දෙහිවල: සීමාසහිත තිසර ප්‍රකාශකයෝ, 1991, පිටුව 16.

[10] රෝහිණී පරණවිතාන (පරි), **එම,** 2009, පිටුව 08.

[11] ලේල්වල සිරිනිවාස හා තවත් අය, **සියබස්ලකර විවරණය,** කොළඹ: ඇස්. ගොඩගේ සහෝදරයෝ, 2002, පිටුව 27.

[12] සුරවීර, **එම**, 1998, පිටුව 40.

[13] රෝහිණී පරණවිතාන (පරි), **එම**, 2009, පිටුව 79.

[14] අමරවංශ හිමි, **එම**, 2000, පිටුව 201.

[15] රෝහිණී පරණවිතාන (පරි), **එම**, 2009, පිටුව 08.

[16] අමරසේකර, **එම**, 1998, පිටුව 78.

[17] ලේල්වල සිරිනිවාස හිමි ඇතුළු තවත් අය, **සියබස්ලකර විවරණය,** කොළඹ: ඇස්. ගොඩගේ සහෝදරයෝ, 2002, පිටුව 27.

[18] රෝහිණී පරණවිතාන (පරි), **එම,** 2009, පිටුව 77.

[19] වික්‍රමසිංහ, **එම,** 1997, පිටුව 34.

[20] ඇම්. බී. ආරියපාල, **කව්සිළුමිණ,** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1965, පිටුව 04.

[21] රෝහිණී පරණවිතාන (පරි), **එම,** 2009, පිටු 93 - 95.

[22] ආරියපාල, **එම,** 1965, පිටුව 01.

[23] **එම**, 02

[24] රෝහිණී පරණවිතාන (පරි), **එම,** 2009, පිටුව 80.

[25] සුරවීර, **එම**, 1998, පිටුව 41.

[26] **එම**,

[27] කෝන්තැන්නේ ආනන්ද හිමි, **මුවදෙව්දා වත සන්නය,** රත්නපුරඃ කෝන්තැන්නේ ආනන්ද හිමි, 1997, පිටුව 06.

[28] කේ. ඩී. පී. වික්‍රමසිංහ. **සස දා වත.** කොළඹඃ ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1961 පිටුව 34.

[29] ආරියපාල, **එම,** 1965, පිටුව 04.

[30] සුචරිත ගම්ලත්, **ගුත්තිල කාව්‍ය විවරණය,** කොළඹඃ සහස්‍ර ප්‍රකාශකයෝ, 2006, පිටුව 19.

[31] ආරියපාල. **එම,** 1965 පිටුව 04.

[32] ඒ. වී සුරවීර, **කතිකාවත් සහ භික්ෂු සමාජය,** බත්තරමුල්ලඃ සී/ස'දීපනී' මුද්‍රණ හා ප්‍රකාශන පෞද්ගලික සමාගම, 2005, පිටුව 56.

[33] අමරවංශ හිමි, **එම,** 2000 පිටුව 202.

[34] පී.බී. සන්නස්ගල, **සිංහල සාහිත්‍යවංශය,** කොළඹඃ සංස්කෘතික දෙපාර්තමේන්තුව. 1994, පිටුව xvii

[35] අසව් ඉසි සැබි හෙළ. **සියබස්ලකර,** කොළඹඃ ගුණසේන සහ සමාගම. 1963. 24 පද්‍ය.

[36] වික්‍රමසිංහ, **එම,** 1991, පිටුව 62.